# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය (නව/පැරණි නිර්දේශය)**

**නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය MACO – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. නිර්මාණය යන්න කෙටියෙන් හඳුන්වා නිර්මාණකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු - 20)

2. පුවත්පත් විශේෂාංග රචනයේ දී යොදාගන්නා නිර්මාණාත්මක ප්‍රවේශ පාඨක ආකර්ෂණය දිනා ගැනීමට හේතු වේ. උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු - 20)

3. විවිධ සංස්කෘතීන්හි අනන්‍යතාව පිළිබඳ නිර්මාණකරුවෙකු තුළ පවත්නා අවබෝධය උසස් නිර්මාණ කාර්යයක් සඳහා හේතුවේ. නිදසුන් ඇසුරෙන් පහදන්න. (ලකුණු - 20)

4. කෝට්ටේ යුගය සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගයයි. සැළලිහිණි සංදේශය හා ගුත්තිල කාව්‍යයේ නිර්මාණාත්මක භාවිතාවන් ඇසුරෙන් විමර්ශනය කරන්න. (ලකුණු - 20)

5. සන්නිවේදන පර්යේෂණ ඔස්සේ ලබා ලබාගන්නා නව දැනුම අර්ථවත් හා නිර්මාණශීලී සංදේශ ගොඩනැංවීමේදී ඉවහල් කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු - 20)

6. ශාන්තිකර්ම හා ගැමි නාටක ආශ්‍රිත සන්නිවේදන ලක්ෂණ නූතන නිර්මාණකරණයේදී බහුල වශයෙන් භාවිතයට ගැනේ. රූපවාහිනී, සිනමා සහ ගීත නිර්මාණ ඇසුරෙන් විමසන්න. (ලකුණු - 20)

7. ජනමාධ්‍ය සංදේශ මගින් ලබා දෙන සැබෑ අර්ථය තේරුම් ගැනීමේදී එහි උඩු පෙළ මෙන්ම යටි පෙළ ද නිවැරදිව අවබෝධ කරගැනීම අත්‍යවශ්‍ය සාධකයකි. නූතන රූපවාහිනී වෙළෙඳ දැන්වීම් පිළිබඳ සංඥාර්ථවේදී විශ්ලේෂණයක යෙදෙන්න. (ලකුණු - 20)

8. පහත මාතෘකා දෙකක් (02) යටතේ සටහන් ලියන්න
   - I. නිර්මාණකරණයේ මූලිකාංග
   - II. ගුවන්විදුලි භාෂාවේ නිර්මාණාත්මක බව
   - III. සිංහල නවකතාවේ නිර්මාණාත්මක ප්‍රවණතා
   - IV. නිර්මාණකරුවා සහ සමාජ මාධ්‍ය (ලකුණු - 10 X 2 =20)

******************************